# තරුණ සිත ගොවිතැනට!

ශම්බද ගොවි තැනටත්, ශම්බද ජීවිතයටත් අප රට තරුණ පරම්පරාවගේ සිත් සතන් යොමු කරවාලීමේ පරමාර්ථයෙන් ආරම්භ කර ගෙන යනු ලබන "තරුණ ගොවි සමිති ව්‍යාපාරය පිළිබඳ හැඳින්වීමක් මේ කලාපයේ කතුවැකියෙන් කෙරී ඇත. මෙහි පළවන්නේ ඒ පිළිබඳ ව්‍යවස්ථා සංක්‍ෂිප්ත යි.

(1) සමිතියේ නම .................................................................................. තරුණ ගොවි සමිතිය යි. එහි ලියුම් ලැබෙන පිළිවෙළ .................................................................................. ලියාපදිංචි කිරීමේ අංකය..............................

(2) ජීවන තත්ත්වය උසස් කරගැනීමට තුඩු දෙන පරිද්දෙන් වඩා හොඳින් ගොවි තැන් කිරීමට හා සමෘද්ධිමත් ගෘහ ජීවනයක් ඇතිකර ගැනීමට තරුණ පරම්පරාව පෙළඹවීම, සමිතියේ පරමාර්ථය යි.

(3) .................................................. වාසය කරන පාසැල් යන වයසේ සිටින සෑම ගැහැණු ළමයෙකුට ම මෙහි සාමාජිකයෙකු විය හැකියි. සෑම සාමාජිකයෙකු ම තෝරාගනු ලබන්නේ මහා සභාවේ ඒකමතික ඡන්දයෙනි. සමිතියේ සංවර්ධනයට අහිතකර සේ පවතින යම් සාමාජිකයෙකු හෝ සාමාජිකයන් වෙතොත්, යුක්ති සහගත හේතු ඇතිව ඔහු හෝ ඔවුන් සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු කරන්නට සමිතියට බලය තිබේ.

(4) සමිතිය සාමාජිකත්වය සඳහා කිසිම අයකිරීමක් නොකරයි. එහෙත් මුදල් අවශ්‍ය අවස්ථාවක් වුවහොත් පහත දැක්වෙන ක්‍රමයකින් අරමුදලක් සපයා ගත හැකියි.

(අ) සාමාජිකයන් සිය කැමැත්තෙන් දෙන ආධාර.

(ආ) පිටතින් ලැබෙන ආධාර.

(ඉ) සමිතිය මගින් සංවිධානය කරනු ලබන විවිධප්‍රසංග ආදියෙන් ලැබෙන ආධාර, යන ක්‍රම වලිනි.

(5) මාසයකට වරක් හෝ හැකි නම් ඊට වඩා වුවද සභා පැවැත්විය හැකියි. සංවත්සර මහ සභාව.............................. මාසයේ පැවැත්වීමට නියම යි. එහිදී—

(අ) සමිතියේ සංවත්සර සභා වාර්තාව හා භාණ්ඩාගාරික නායකයින් ගේ වාර්තා කියවා සම්මත කර ගැනීම.

(ආ) ගණන් හිලව් අනුමත කිරීම.

(ඉ) සාමාජිකයන් හා කාරක සභාව පත්කර ගැනීම.

(ඊ) ව්‍යවස්ථා සංශෝධනය කිරීම (අවශ්‍ය නම්)

(උ) ගොවිකර්මාන්තයේ ඒ ඒ අංශවලට සාමාජිකයන්ගේ ඇති ආශාව පරිදි කණ්ඩායම් තෝරා පත්කර ගැනීම.

(ඌ) දැනුම් දී තිබෙන වෙනත් කරුණු, යනාදී කටයුතු සිදු කළ හැකියි. මහා සභාවක් පැවැත්වීමට පැමිණිය යුතු අඩුම සාමාජික සංඛ්‍යාව

Do not wait—Cultivate!

බලා නොසිටින්න! ගොවිතැන් කරන්න!

20 ක් හෝ මුලු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි. මෙයින් අඩුවූ එක අනුගමනය කල හැකිය.

(6) සභාපති, උප සභාපති, ලේකම්, උප ලේකම්, භාණ්ඩාගාරික (අවශ්‍ය නම් සහ ඒ ඒ කාණ්ඩායම්වල නායකයන්ගෙන් කාරක සභාව සමන්විත වේ. කාරක සභාවකට ගණන 7 දෙනෙකි.

(අ) සාමාජිකයන්ගේ සහ ආසන්න ප්‍රදේශයේ දියුණුවට සරිලන විධියේ ආදශී ගොවිතැන් ව්‍යාපාර එකක් හෝ වැඩි ගණනක් සංවිධානය කර ගැනීම.

(ආ) ගොවිකම්ාන්ත ඥනය වඩීනය කර ගැනීමට ඉවහල්වන චාරිකා ගමන් ආදශී ගොවි දින බැලීමට යන ගමන් හා වෙනත් දැකුම්කලු දේ නැරඹීමට යන ගමන් පිළියෙල කර ගැනීම.

(ඉ) සාමාජිකයන් කැමති විෂයයන් අනුව, ප්‍රසිඩ කථා, සිනමා චිත්‍ර. ආලෝක චිත්‍රානුසාරයෙන් කරන කථා, ආදිය පිළියෙල කර ගැනීම

(ඊ) කෘෂිකම් නිලධාරීන්ගේ සහාය ඇතිව ආදශී ගොවි දින පිළියෙල කර ගැනීම.

(උ) තමන්ගේ ගෙදර දොරේ, මී මැස්සන්, එලු කුකුල් ගව සතුන් ඇති කිරීමට හා ගෙවතු වගා කිරීමට විධිවිධාන යෙදීම හා, කෘෂිකම් නිලධාරීන් හා නායකයන් කැඳවා උපදෙස් ලබා ගැනීම.

(ඌ) සාමාජිකයන් අතර තරඟ සංවිධානය කිරීම.

(එ) සාමාජිකයන්ගේ දියුණුව අරභයා ආදශී ගොවිදින හා ප්‍රදශීන පිළියෙල කර ගැනීම.

(ඒ) සාමාජිකයන්ගේ වැඩ කටයුතු හා පැමිණීම පිළිබඳ සටහන් විධිමත් ලෙස තබා ගැනීම. යනාදී දේ කල යුතුයි.

(8) සමිතියේ පොත් පත් සෑහෙන කවර වේලාවක වුවද සෝදිසි කර බැලීමට සාමාජිකයන්ට මෙන්ම ගොවිකම්ාන්ත, දෙපාතීමේන්තුවේ නිලධාරීන්ට ද බලය තිබේ.

(9) මෙම ව්‍යවස්ථාවල සඳහන් පරිදි ස්වකීය මූලික පරමාර්ථයන්ගෙන් පිට පනින යම් සමිතියක් වෙතොත් එහි නීත්‍යානුකූල ලියා පදිංචි කරවීම අවලංගු කරනු ලැබේ.

---

## පෘතුගීසි තෝම්බුවෙන්.....

වතු 4 යි. අමුණු 3 1/2 ක හා කුරිණි 4 ක කුඹුරයි.

## පට්ටිය (Patia)

මෙය පනිතුරේට යාබදව තිබේ. මෙහි සිටින ඉතා ප්‍රසිඩ සිංහලයා නම් හේග නායගි මුදලියා යි (1631 කේ දී පට්ටියේ සිටි, පසුව මාතර කොට්ටුවේ මුදලි පදවිය කල ස්කනායක මුදලිඳු විය යුතුයි) ඔහුට වතු 6 ක් ප්‍රවේණි වශයෙන් තිබුණේය.

ඔහු මුදලට ගත් ඉඩම් අතර:– ගස් 460ක වතු 4 යි. අමුණු 3 ක කුඹුරු 5 යි.

දෙන් මනුවෙල්: ගස් 25 ක වතු 1 යි. පැල 3 ක කුඹුරු 2 යි.

විරසිංහ ආරච්චි: ගස් 220 ක වතු 3 යි. පැල 3 ක හා කුරිණි 5 ක කුඹුරයි.

මෙයට "පට්ටිය" යන නම සෑදුනේ කිරි ගන්නා මිනිසුන්ට අයිති වතු 9 ක් තිබුණු නිසාය.

## ගොරකාන (Gorquahanna)

මෙයත් පනිතුරේට යාබදවයි. කොළඹ ලුවිස් කාමලෝට් අයිති ගස් 15 ඉඩම් කෑල්ලක් මෙහි ඇත.

මනුවෙල් කබ්රාල්; ගස් 70 ක ඉඩම් 2 යි. පැලක ඔප්පටයි.

වෙදහේන දූරයා: ගස් 70 ඉඩම් 2 යි.
විතාරණ: ගස් 50 ඉඩම් 2 යි.

මෙහි සිටි විශාලම ඉඩම් හිමියා මනුවෙල් ප්‍රනාන්දුයි. ඔහුට ගෙඩි 12,000 ක් කැඩෙන ගස් 800 ක් ඇති ඉඩම් 3 ක් විය.

අන්තෝනියෝ ප්‍රනාන්දු: ගස් 120 ක ඉඩම් 3 යි.

මෙහි පදිංචි මරක්කලයින්ට අයිති ගස් 232 ක ඉඩම් 7 ක් විය. කලින් ලංකාවේ වැසියන්ට ඇතිබව තිබුණු මේ මිසුව "මුට්ටෙටු ඉඩම්" වී තිබේ.

Waste not – want not

නාස්ති නොකිරීමෙන් නැති බැරි කම පිටු දකින්න!